සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade	6 ශ්‍රේණිය	ඉතිහාසය I - II	කාලය / நேரம் / Time	පැය 2 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

සැලකිය යුතුයි :

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

I කොටස

❖ **අංක 1 සිට 5 තෙක් දී ඇති වාක්‍යය සම්පූර්ණ කිරීමට සුදුසු වචනය වරහන් තුලින් තෝරා හිස්තැන මත ලියන්න.**

1) පුරාණ කාලයේ දී සාර්ථක ලෙස ගොවිතැන් කල නිසා ශ්‍රී ලංකාව පෙරදිග ..... යනුවෙන් හඳුන්වන ලදී. (මුතු ඇටය / ධාන්‍යාගාරය)

2) පළමුවරට රබර් බෝලයක් සාදන ලද්දේ ..... ශිෂ්ටාචාර වැසියන් විසිනි. (චීන / මායා)

3) නෙෆනෙෆාවුටෙන් නෙෆර්ටිටි රැජින පාරාවෝ රජෙකු වූ ..... රජුගේ බිසවයි. (අක්හෙනතන් / ටුටන්කාමන්)

4) මහසෙන් රජු විසින් ඉදිකරන ලද හුරුළු වැව අතීතයේ දී හඳුන්වන ලද්දේ ..... යනුවෙනි. (බානු වාපි / වල්මුර වාපි)

5) කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙනයාම සඳහා ධාතුසේන රජු විසින් ..... ඉදි කරන ලදී. (යෝධ ඇළ / ඇළහැර ඇළ)

❖ **අංක 06 සිට 10 තෙක් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදිනම් (×) ලකුණ ද වරහන් තුල යොදන්න.**

6) මැමත් අලි මහා හිම යුගයේ ජීවත් වූ සත්ත්ව විශේෂයකි ( )

7) දඩයක්කරුවෙකු බෙලි කටුවක් විද සකස් කරගත් තැල්ලක් කිතුල්ගල බෙලිලෙනෙන් හමුවිය ( )

8) විජය කුමරු නැගෙනහිර වෙරළේ පිහිටි තම්බපණ්ණිය ට ගොඩබැස ඇත ( )

9) අරිට්ඨ කුමරු පැවිදි විමත් සමඟ මෙරට භික්ෂු ශාසනය ආරම්භ විය ( )

10) දුටුගැමුණු හා එළාර රජු අතර යුද්ධය ඇතිවූයේ අනුරාධපුරයේදී ය ( )

Past Papers Wiki

❖ **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

11) ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා යොදාගනු ලබන පැරණිම සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?

1. මහාවංශය 2. දීපවංශය 3. ථූපවංශය 4. බෝධි වංශය

12) ප්‍රථම වරට ගොඩබිම සතුන් බිහි වූ කාලය හඳුන්වනු ලබන්නේ

1. පැලියසොයික යුගය යනුවෙනි
2. මහා හිම යුගය යනුවෙනි
3. හෙලෝසින යුගය යනුවෙනි
4. සිලූරියන් යුගය යනුවෙනි

13) මිනිසා ගොවිතැන ට හුරුවීම නිසා සමාජය තුල ඇති වූ ප්‍රධාන වෙනස්කම වන්නේ

1. ගම්මාන බිහිවීම යි
2. සතුන් දඩයම් කිරීම අත්හැරීමයි
3. ධාන්‍ය වගා කිරීමයි
4. ලෝහ වර්ග සොයාගැනීමයි

14) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ව්‍යාප්ත වී පැවති ප්‍රදේශය වර්තමානයේ හඳුන්වනු ලබන්නේ

1. ඉරාකය යනුවෙනි 2. ඉරානය යනුවෙනි 3. ඊජිප්තුව යනුවෙනි 4. තුර්කිය යනුවෙනි

15) මාතලේ අලු විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ කුමන රජුගේ පාලන කාලයේදි ද?

1. මහසෙන් රජු 2. දුටුගැමුණු රජු 3. වසභ රජු 4. වලගම්බා රජු

❖ **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න**

16) ඉතිහාසය හැදෑරීම සඳහා යොදාගන්නා ඕනෑම දෙයක් ..... යනුවෙන් හැඳින් වේ

17) ක්‍රමානුකූල ව පොළොව හාරා බැලීමෙන් ඉතිහාස කාලය මැන ගැනීම ..... කැණීම යනුවෙන් හැඳින් වේ

18) මිය ගිය නැදෑයින් වෙනුවෙන් අවමංගල්‍ය චාරිත්‍ර පැවැත්වීම ට මිනිසුන් හුරුපුරුදු වූයේ ..... යුගයේදීය.

19) පණ්ඩුකාභය රජු විසින් අනුරාධපුරයේ ඉදිකරන ලද අභය වැව වර්තමානයේ හඳුන්වනු ලබන්නේ ..... වැව නමිනි

20) වසභ රජු යාපනය ප්‍රදේශය පාලනය කිරීම සඳහා ..... ඇමති පත් කරන ලදී

(2 X 20 - ලකුණු 40)

Past Papers Wiki

II - කොටස


සැලකිය යුතුයි :

- ❖ මෙම කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ
- ❖ පළමු ප්‍රශ්නය හැර තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න
- ❖ ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි

---

1. අ) A හා B යටතේ දක්වා ඇති පින්තූරය අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට අදාල පිළිතුරු අනුපිළිවලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න

A රූපය



I. යාබද A රූපයේ දැක්වෙන සත්ත්ව රූපය නම් කරන්න
II. එය හමු වූ රට කුමක් ද?
III. මෙම සත්ත්වයා ජීවත් වී ඇත්තේ කුමන පරිසරයක ද?
V. මෙම සත්ත්වයාගේ ශරීර අංගයක් නම් කරන්න

(2 X 4 - ලකුණු 08)

B රූපය



I. යාබද B රූපයේ දැක්වෙන්නේ කුමක් ද?
II. එය ඉදිකරන ලද පාලකයා නම් කරන්න
III. මෙය පිහිටා ඇති නගරය කුමක් ද?
IV. මෙහි වැඩ කටයුතු අවසන් කල පාලකයා නම් කරන්න

(1 X 02 - ලකුණු 08)

2. I. ඉතිහාසය හැදෑරීම සඳහා යොදාගනු ලබන මූලාශ්‍රය වර්ග දෙක නම් කරන්න (ලකුණු 02)

II. ඔබේ පාසලේ ඉතිහාසය හැදෑරීම සඳහා යොදාගනු ලබන පහත සඳහන් දෑ ඔබ විසින් ඉහත නම් කරන ලද මූලාශ්‍රය වර්ග දෙක යටතේ බෙදා දක්වන්න

A. ලොග් සටහන් පොත
B. සමරු ඵලක
C. පැරණි ගොඩනැගිලි
D. සිසුන් ඇතුලත් කිරීමේ ලේඛනය (ලකුණු 04)

III. A - ඉතිහාස කාල මැනීම සඳහා සුලබ වශයෙන් යෙදාගනු ලබන ක්‍රම දෙකක් නම් කරන්න (ලකුණු 02)
B - පහත සඳහන් වර්ෂ ක්‍රම ආරම්භ වීමට මුල් වූ හේතු මොනවා ද? (ලකුණු 03)
a) බුද්ධ වර්ෂ - b) ශක වර්ෂ - c) හිජ්රි වර්ෂ -

3. I. A - පෘථිවියේ බිහිවූ ජීවයක් සහිත පළමු සත්ත්වයා හඳුන්වන නම කුමක් ද? (ලකුණු 02)
B - පළමු වර ට ගොඩබිම පහළ වූ සත්ත්වයා නම් කරන්න (ලකුණු 02)

II. පහත A, B, C හා D යටතේ දක්වා ඇති මානවයන් සතු වූ විශේෂ දක්ෂතා වරහන් තුල දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න

A. ඔස්ට්‍රලෝපිතිකස්
B. හෝමෝ හැබිලස්
C. හෝමෝ ඉරෙක්ටස්
D. හෝමෝ නියැන්ඩතාලන්සිස් (ලකුණු 04)

(සත්ත්ව ඇටකටු වලින් නිවාස සැදීම, දෙපයින් ඇවිද යාම, ගින්දර සොයා ගැනීම, ගල් මෙවලම් තැනීම)

III. A - සංස්කෘතික දියුණුව යනු කුමක් ද? (ලකුණු 02)
B - මෙවලම් වල ස්වරූපය අනුව මිනිසාගේ සංස්කෘතික දියුණුව බෙදෙන ප්‍රධාන අවධි තුන නම් කරන්න (ලකුණු 03)

4. I. පහත සඳහන් ශිෂ්ටාචාර ව්‍යාප්තව පැවති ගංඟා නිම්න නම් කරන්න
A. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය B. ඊජිප්තු ශිෂ්ටාචාරය (ලකුණු 02)

II. A - මෙසපොතේමියානු වැසියන් දෙවියන්ට පුද පූජා පැවැත්වීම සඳහා භාවිත කල ස්ථාන හැදින් වූ නම කුමක් ද? (ලකුණු 01)
B - ඔවුන් විසින් පුද පූජා පැවැත් වූ දෙවිවරු තිදෙනෙක් නම් කරන්න (ලකුණු 03)

III. පහත සඳහන් ශිෂ්ටාචාර වලට අයත් නිර්මාණ කිපයක් වරහන් තුල දක්වා ඇත. ඒවා අදාල ශිෂ්ටාචාරය සමඟ ගලපා වගුව සම්පූර්ණ කරන්න
(සෙල්ලම් මැටි කරත්තය, පිරමීඩ, රාජකීයෙකු පක්ෂින් හඹා යන සිතුවම, නාවුක යාත්‍රා, පූජක මූර්තිය)

ශිෂ්ටාචාරයේ නම	නිර්මාණය
1. මෙසපොතේමියානු	a) .....
2. ඉන්දු නිම්න	b) ..... c) .....
3. ඊජිප්තු	d) ..... e) .....

(ලකුණු 05)

5. I. මුලින්ම මෙරට වාසය කල ජනතාව ආහාර සපයා ගන්නා ලද ක්‍රම දෙක නම් කරන්න (ලකුණු 02)
II. A - විජය කුමරු පැමිණෙන විට මෙරට ජීවත් වූ ග්‍රෝත්‍රික ජන කණ්ඩායම් තුන නම් කරන්න (ලකුණු 03)
B - කුවේණි අයත් වුයේ ඉන් කුමන ග්‍රෝත්‍රික ජන කණ්ඩායමට ද? (ලකුණු 01)
III. A - විජය කුමරු සමඟ පැමිණි පිරිස ජනාවාස පිහිටුවා ගන්නා ලද්දේ කුමන ගංඟාව ආශ්‍රිතව ද? (ලකුණු 02)
B - ඔවුන් විසින් පිහිටුවන ලද ජනාවාස තුනක් නම් කරන්න (ලකුණු 03)

6. I. A - වසභ රජු අයත් වන රාජවංශය කුමක් ද?
B - යාපනය ප්‍රදේශයේ හමු වූ එතුමා විසින් පිහිටුවන ලද රන් පත් ඉරුව කුමක් ද? (ලකුණු 02)
II. A - වසභ රජු විසින් ඉදිකරන ලද වැව් තුනක් ලියන්න (ලකුණු 03)
B - ඔහු විසින්ඉදිකල ඇළ මාර්ගයක් නම් කරන්න (ලකුණු 01)
III. A - බුදු දහමේ දියුණුව සඳහා වසභ රජු ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් ලියන්න (ලකුණු 02)
B - වසභ රජු විසින් අනුරාධපුර නගරය අලංකාර කිරීම සඳහා ක්‍රියා කල ආකාරය කරුණු තුනක් මගින් ලියා දක්වන්න (ලකුණු 03)

7. I. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ සිදු වූ බෞද්ධයන්ට ඉතා වැදගත් වූ සිද්ධීන් දෙක නම් කරන්න (ලකුණු 02)

II. පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රකාශ හා සම්බන්ධ පාලකයන් වරහන් තුලින් තෝරා නිවැරදි පිළිතුර ලියන්න
A. අනුරාධපුරය අංග සම්පූර්ණ නගරයක් ලෙස ඉදි කිරීම
B. අභයගිරි දාගැබ ඉදිකොට කුපික්කලතිස්ස තෙරුන්ට පූජා කිරීම
C. මින්නේරි දෙවියන් ලෙස ජනතා ගෞරවයට පාත්‍ර වීම
D. අනුරාධපුරයේ මහපාලි දානශාලාව ප්‍රතිසංස්කරණය කිරීම
(ධාතුසේන රජු, පණ්ඩුකාභය රජු, මහසෙන් රජු, වලගම්බා රජු) (ලකුණු 04)

III. A - වලගම්බා රජු විසින් ඉදි කරන ලද ආගමික ස්ථාන දෙකක් නම් කරන්න (ලකුණු 02)
B - දුටුගැමුණු රජුගෙන් ඉටු වූ සේවාවන් තුනක් ලියන්න (ලකුණු 03)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank